# විදේශ රටවල සේවා නියුක්තකයින් සඳහා වන ණය යෝජනා ක්‍රමය

PEOPLE'S BANK
Pride of the Nation

වර්තමානයේ ආර්ථිකයට අත්‍යවශ්‍ය සාධකයක් වන විදේශ විනිමය ප්‍රවර්ධනය කිරීමේ රාජ්‍ය ප්‍රතිපත්තියට අනුගත වෙමින් මහජන බැංකුව විසින් විදේශ රටවල සේවා නියුක්තකයින් සඳහා වන ණය යෝජනා ක්‍රමය හඳුන්වාදී ඇත.

මෙම ණය යෝජනා ක්‍රමය යටතේ විදේශගත ශ්‍රමිකයින් හට නිවාස කටයුතු, වාහන මිළදී ගැනීම යනාදී විවිධාකාරවූ අවශ්‍යතාවයන් සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම් මෙමගින් ප්‍රදානය කෙරේ.

**විශේෂ ප්‍රතිලාභ**

- තරගකාරී පොලී අනුපාත
- අවම ලියකියවිලි
- ලිහිල් කොන්දේසි

**යෝග්‍යතාව**

- අයදුම්කරු ස්ථිර නේවාසික වීසා (Permanent Residency VISA/PR) යටතේ විදේශයක පදිංචි ශ්‍රී ලාංකිකයෙකු විය යුතුය.

  හෝ
- අයදුම්කරු ද්විත්ව පුරවැසියෙකු විය යුතුය.

  හෝ
- අයදුම්කරු විදේශයක සේවා නියුක්තිකයෙකු විය යුතුය. (විගමිකයින් හැර)

**පොලී අනුපාතය**

www.peoplesbank.lk වෙබ් අඩවිය ඔස්සේ තොරතුරු ලබාගත හැක.

ආපසු ගෙවීමේ කාලය

- උපරිම ආපසු ගෙවීමේ කාලය වසර 10 කි. (ණය මුදලට අදාල සියළු කරුණු පිළිබඳව සිදු කරන ක්‍රමවත් ඇගයීමකින් පසු ආපසු ගෙවීමේ කාලය තීරණය කරනු ලබයි.)

**ගාස්තු/කොමිස්,පොලී ආදිය**

- ස්ථාවර පොලී අනුපාත
- ක්‍රමික ආපසු නොගෙවීමකදී, මුල් මුදල සඳහා අයකරන දඩ පොලිය
- හිඟ වාරික සඳහා දඩ පොලිය
- නියමිත ලිපි ද්‍රව්‍ය ගාස්තු
- ගිවිසගත් කාලයට ප්‍රථම ණයමුදල ගෙවා අවසන් කිරීමකදී අයකරනු ලබන ණයමුදල කලින් පියවීමේ ගාස්තු
- තක්සේරු ගාස්තු ( අදාල නම් පමණක්)
- නෛතික ගාස්තු ( අදාල නම් පමණක්)
- මුද්දර ගාස්තු ( අදාල නම් පමණක්)
- රක්ෂණ ගාස්තු ( අදාල නම් පමණක්)

## අයදුම් කිරීමේ ක්‍රමය

- අයදුම්කරු සතු පහත ලියකියවිලි සමඟ ළඟම ශාඛාව හෝ සේවා මධ්‍යස්ථානය විසිත්ත කළයුතුය.
- - ගුවන් ගමන් බලපත්‍රයේ සහ වීසා බලපත්‍රයේ පිටපත
  - ආසන්න මාස 03 ක වැටුප් පත්‍රිකා
  - සෙවා ගිවිසුමේ / පත්වීමේ ලිපියේ පිටපත සහ සේවා යෝජක වෙතින් රැකියාවේ වත්මන් තත්ත්වය පිළිබඳව ලබාදෙන ලිඛිත තහවුරුව.
  - බැංකු ප්‍රකාශන/ විදේශ ප්‍රේෂණ තහවුරු කර ගැනීම සඳහා පසුගිය මාස 03 ක බැංකු පාස්පොත ( දේශීය හෝ විදේශීය බැංකුවක)

*ඉහත ලියවිලි ඉංග්‍රීසි මාධ්‍යයෙන් හැර වෙනත් මාධ්‍යයකින් පවතිනම්, දිවුරුම් දුන් භාෂා පරිවර්තකයෙකු මගින් එකී ලියවිලි ඉංග්‍රීසි මාධ්‍යයට පරිවර්තනය කළ යුතුය. (අවම වශයෙන් අවසාන වැටුප් පත්‍රිකාව සහ සේවා ගිවිසුම ඉංග්‍රීසි මාධ්‍යයට පරිවර්තනය කළ යුතුය.)

## නියමයන් සහ කොන්දේසි

- විදේශගත ශ්‍රමිකයා වෙනුවෙන් ණය පහසුකම ලබා ගැනීමට කටයුතු ඉටු කිරීම සඳහා ඔහුගේ සමීපස්ථ ඥාතියෙකු ඇට(ර්)නි බලකරු වශයෙන් පත් කළ හැකිය. නීති නිලධාරීගේ උපදෙස් පරිදි මෙම ඇට(ර්)නි බලපත්‍රය සඳහා අතිරේක කොන්දේසි ඇතුළත් කළහැකිය. අයදුම්කරු සේවයෙහි නියුක්ත රටෙහි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය මගින් මෙම ඇට(ර්)නි බල පත්‍රය සහතික කළයුතුය. අයදුම්කරු ශ්‍රීලංකාවේ සිටියදී ණයමුදල අයදුම් කරනු ලබන්නේ නම් අදාල ඇට(ර්)නි බලපත්‍රය තානාපති කාර්යාලය මගින් සහතික කිරීම අවශ්‍ය නොවේ.
- ඉහත ඇට(ර්)නි බලපත්‍රය රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කළයුතුය.
- ඇපකරුවන් රාජ්‍ය අංශයේ/ පෞද්ගලික අංශයේ පිළිගත් ආයතනවල සේවා නියුක්තිකයින් විය යුතුය.
- අයදුම්කරුගේ කලත්‍රයා /දෙමාපියන්/දරුවන හෝ සමීපස්ථ ඥාතියෙකු හා බද්ධව ණයමුදල සළකා බැලිය හැකිය.
- ණයමුදලේ වටිනාකම නොසළකා ණය තොරතුරු කාර්යාංශ වාර්තාව මගින් අයදුම්කරුවන්ගේ සහ ඇපකරුවන්ගේ ණය බැදීම් පරීක්ෂා කරනු ලබන අතර, එකී වාර්තාවට අනුව ණය අයදුම්කරු සහ ඇපකරුවන් ණය ගෙවීම පැහැර හරින්නන් නොවිය යුතුය.

## පැමිණිලි හැසිරවීමේ ක්‍රියා පටිපාටිය

- ණයකරු හට info@peoplesbank.lk හරහා පැමිණිල්ල යොමු කළහැක.
- අදාල ශාඛාව, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය හෝ ප්‍රධාන කාර්යාලය වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කළ හැකිය.
- අදාල ශාඛාව, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය හෝ ප්‍රධාන කාර්යාලය වෙත ඇමතීම මගින් පැමිණිල්ල ඉදිරිපත් කළ හැකිය.

## වැඩිදුර තොරතුරු

- www.peoplesbank.lk වෙත පිවිසෙන්න
- ඇමතුම් මධ්‍යස්ථානය - 1961
- ප්‍රධාන කාර්යාලය - 0112481481